0003

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**නව යෞවනයන් පිළිබඳ මනෝවිද්‍යාව – ESU4301**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 01** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. යෞවනවිය මුල් නවයොවුන්විය, මැද නවයොවුන්විය සහ පසු නවයොවුන්විය ලෙස අනු අවධි තුනකට වෙන් කළ හැක. මැද නවයොවුන්වියේ දරුවන් පෙන්වන සුවිශේෂී ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

02. නවයෞවනයන් තුළ හටගන්නා සීඝ්‍ර කායික සංවර්ධනය නිසා ඔවුන් මුහුණ දෙන ගැටලු තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

03. පියාජේට අනුව නවයෞවනයන් වියුක්ත චින්තන අවධියට අයත් ය. ඔවුන් තුළ දක්නට ලැබෙන ප්‍රජානන චර්යා ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න.

04. නවයෞවන දරුවන්ගේ චිත්තවේගික ගැටලු විසඳීමට දෙමාපියන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පහක් (05) දක්වන්න.

05. 'සමවයස් කණ්ඩායම් නවයෞවනයන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරයි.' මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා හේතු තුනක් (03) දක්වන්න.

06. නිවැරදි අගයයන් නවයෞවන දරුවන්ට ඉගැන්වීම සඳහා දෙමාපියන් හා ගුරුවරුන්ට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහක් (05) සඳහන් කරන්න.

07. සංවර්ධන මනෝවිද්‍යාඥයන් විසින් හඳුනාගෙන ඇති පරිදි නවයොවුන් වියේ දරුවන් තුළ 'තරහ' වැඩිවීමට බලපාන හේතු තුනක් (03) පැහැදිලි කරන්න.

08. මනා පෞරුෂයක් ඇති නවයෞවනයෙකු තුළ දැකිය හැකි ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

0003

## 2 වන කොටස

09. (i) ප්‍රජනන සංවර්ධනයේ උච්චත ම අවධිය ලෙස සැලකෙන්නේ විධිමත් ක්‍රියාකාරී චින්තන අවධියයි. පියාජේගේ අදහස්වලට අනුව මෙම අවධිය තුළදී දැකිය හැකි විධිමත් ක්‍රියාකාරී චින්තනයෙහි ලක්ෂණ දෙක (02) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ළමයින්ගේ හා නවයෞවනයින්ගේ චින්තන ක්‍රියාවලින්හි දැකිය හැකි වෙනස්කම් හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(iii) නවයෞවන අවධිය තුළදී අත්දකින සීඝ්‍ර බුද්ධි සංවර්ධනය නිසා නවයෞවනයින් මුහුණදෙන ගැටලු දෙකක් (02) සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iv) එම ගැටලු අවම කිරීමට දෙමාපියන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

10. (i) ඕනෑම පෞරුෂ න්‍යායයක් තෝරාගෙ එහි මූලික සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) ඔබ තෝරාගත් න්‍යායට අනුව නවයෞවනයන් තුළ පෞරුෂ වර්ධනය සිදුවන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) නවයෞවනයන් තුළ සමබර පෞරුෂයක් වර්ධනය කිරීම සඳහා ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 07)

11. (i) නවයෞවන අවධිය තුළ දැකගත හැකි කැපී පෙනෙන සමාජයීය අවශ්‍යතා හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) එම සමාජයීය අවශ්‍යතාවන් ඉටුකර ගැනිමට නවයෞවනයාට සහාය වීමේදී පවුලේ කාර්යභාරය විමසන්න. (ලකුණු 07)

(iii) නවයෞවනයින්ගේ සමාජයීය සංවර්ධනය ආශ්‍රිතව පැන නඟින පොදු ගැටලු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

00034

12. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) ශ්‍රී ලංකාව තුළ පවතින තරුණ අසහනයට හේතු

(ආ) සමාජය යෞවනයන්ගේ ආකල්ප පිළිබඳව වැඩි අවධානයක් යොමු කළයුත්තේ ඇයි?

(ඇ) යෞවනයින්ගේ ස්වසංකල්පය සංවර්ධනය කිරීමේදී දෙමාපියන්ගේ කාර්යභාරය

(ඈ) නවයෞවනයින්ගේ ආත්ම කේන්ද්‍රිය චින්තනය

(ලකුණු 10 x 2= 20)

13. (i) නවයෞවනවියේ කැපීපෙනෙන 'අභිරුචි' වර්ග හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) නවයෞවනයන්ගේ අභිරුචි ආශ්‍රිත ලක්ෂණ දෙක (02) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නවයෞවනයා තුළ අධ්‍යාපනික දියුණුවට අදාළ අභිරුචි වර්ධනය කිරීම හා ඉගෙනීම කෙරෙහි ධනාත්මක ආකල්ප ඇති කිරීම සඳහා ගුරුවරයා ක්‍රියා කළයුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. නවයෞවනයන් තුළ සෘණාත්මවක හැඟීම් ඇතිවන්නේ සමායෝගය ආශ්‍රිත ගැටලු ඇතිවිට ය.

(i) නවයෞවනයන් තුළ පැනනඟින සමායෝගය පිළිබඳ ගැටලු හතරක් (04) සඳහන් කරන්න.

(ලකුණු 04)

(ii) ඔබ ඉහත සඳහන් කළ එක් ගැටලුවක් තෝරාගෙන එයට බලපෑ හැකි හේතු සාකච්ජා කරන්න. (ලකුණු 08)

(iii) හොඳින් සමායෝගීවූ නවයෞවනයන් ඇති කිරීමට වැඩිහිටියන්ට අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.

00034

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**BACHELOR OF EDUCATION(NATURAL SCIENCES)**
**DEGREE PROGRAMME-LEVEL 6**
**FINAL EXAMINATIONS – 2015**
**ESU4301 – PSYCHOLOGY OF THE ADOLESCENT**
**DURATION – THREE (03) HOURS.**

Date: 01st April 2015 Time: 1.30 p.m. 4.30 p.m.

**Answer all questions in Part I & any three (03) questions from Part II.**

## PART I

01. Adolescence stage can be divided into three sub stages namely, pre adolescence, middle adolescence and late adolescence. State five (05) specific features shown b children in the middle adolescence stage.

02. Explain briefly **three (03)** problems encountered by adolescents due to rapid physiological development occurred with in them.

03. According to Piaget, adolescents belong to the stage of formal operations. Explain **three (03)** cognitive characteristics that can be seen in them.

04. State **five (05)** strategies that should be followed by parents to solve emotional problems of adolescent children.

05. "Peer groups have a powerful impact on personality development of adolescents". State **three (03)** reasons to support this statement.

06. State **five (05)** procedures that can be followed by parents and teachers for teaching correct values to adolescent children.

07. As identified by developmental psychologist, indicate three (03) reasons for increasing 'anger' among adolescent children.

08. State **five (05)** features that can be seen in an adolescent with a good personality.

(5 x 8 = 40 marks)

## PART II

09. i. The stage of formal operations is considered as the highest stage of cognitive development. In line with the Piaget's views explain **two (02)** cognitive characteristics of formal operations those are visible among in this stage.

(06 marks)

ii. State **four (04)** differences of the thought process of children and adolescents.

(04 marks)

iii. Discuss **two (02)** problems faced by adolescents due to cognitive development experienced in this stage.

(04 marks)

iv. Explain briefly the strategies that should be followed by parents to minimize those problems.

(06 marks)

10. i. Select any personality theory and explain it's basic concepts.

(06 marks)

ii. According to the theory that you have selected discuss how personality development in taking place in adolescents.

(07 marks)

iii. Explain the role of the teacher in developing a balanced personality in adolescents.

(07 marks)

11. i. State **four (04)** prominent social needs visible in the adolescence stage.

(04 marks)

ii. Examine the functions of the family in helping adolescents to fulfill those social needs.

(07 marks)

iii. Explain briefly **three (03)** common problems that are arisen in relation to social development of adolescents.

(09 marks)

12. Write short notes on any **two (02)** of the topics stated below.

a. Reasons for youth unrest in Sri Lanka.

b. Why should the society pay attention on the attitudes of adolescents?

c. Function of parents in developing the self concept of adolescents.

d. Egocentric thinking of adolescents.

(10 x 2 = 20 marks)

13. i. State **four (04)** types of interests that are prominent in the adolescence stage.

(04 marks)

ii. Describe **two (02)** features of interests of adolescents.

(08 marks)

iii. Explain how teacher should act for developing interests related to educational development and inculcating positive attitudes towards learning.

(08 marks)

14. Negative feelings are produced with in adolescents when they are faced with adjustment problems.

i. State **four (04)** adjustment problems that may arise in adolescents.

(04 marks)

ii. Select one of the adjustment problems mentioned above and discuss the possible reasons leading to it.

(08 marks)

iii. Explain the strategies with examples that can be followed by parents to produce well adjusted adolescents.

(08 marks)

*-Copyrights reserved-*